ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

## ඉන්දියා - ශ්‍රී ලංකා බලශක්ති හවුල්කාරිත්වයේ සන්ධිස්ථානයක්

ශ්‍රී ලංකා රජයේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහ M/s. U සෝලා ක්ලීන් එනර්ජි සොලියුෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින් යාපනයට ඔබ්බෙන් ඩෙල්ෆ්ට්, නයිනතිවු සහ අනලයිතිවු දූපත්වල දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ගිවිසුම 2024 මාර්තු 1 වන දින ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා සහ විදුලිබල සහ බලශක්ති රාජ්‍ය අමාත්‍ය ඉන්දික අනුරුද්ධ මහතා ඉදිරියේදී අත්සන් තබන ලදී. දූපත් ත්‍රිත්වයේ ජනතාවගේ බලශක්ති අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් ක්‍රියාත්මක කරන මෙම ව්‍යාපෘතිය ඉන්දීය රජයේ ප්‍රදාන යටතේ ක්‍රියාවට නැංවේ. ධාරිතා ප්‍රශස්තකරණය උදෙසා මෙම දෙමුහුන් ව්‍යාපෘතිය සූර්ය බලය සහ සුළං ඇතුළු විවිධ බලශක්ති ප්‍රභවයන් විදුලි ජනනය සඳහා භාවිතා කරනු ඇත.

2. දූපත් ත්‍රිත්වයේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක, ජාතික බලශක්ති පද්ධතියට සම්බන්ධ කර නොමැති මෙම ව්‍යාපෘතිය සඳහා ඉන්දීය රජයේ සහයෝගය ද්විපාර්ශ්වික බලශක්ති හවුල්කාරිත්වයට මෙන්ම සංවර්ධන හවුල්කාරිත්වයේ මනුෂ්‍ය කේන්ද්‍රීය ස්වභාවයට ඉන්දීය රජය ලබාදෙන වැදගත්කම අවධාරණය කරයි. 2023 ජූලි මස ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ඉන්දීය සංචාරය අතරතුර ප්‍රකාශයට පත් කරන ලද ඉන්දියා - ශ්‍රී ලංකා ආර්ථික හවුල්කාරිත්ව දැක්මේ ප්‍රමුඛතා ක්ෂේත්‍රයක් ලෙස බලශක්ති ක්ෂේත්‍රය හඳුනාගෙන ඇත. විදුලිබල ජාල සම්බන්ධකතාවය සහ බහු නිෂ්පාදන ද්වි දිශානතික තෙල් නළය වැනි විවිධ සුවිශේෂී මුලපිරීම් රැසක් සම්බන්ධයෙන් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සාකච්ඡා කරමින් පවතී.

3. ඉන්දීය රජයේ සමස්ත සංවර්ධන හවුල්කාරිත්ව කළඹ ඇමරිකානු ඩොලර් බිලියන 5ක් වන අතර එයින් ඇමරිකානු ඩොලර් මිලියන 600ක් පමණ ම ප්‍රදාන වේ. 1990 සුවසැරිය ගිලන්රථ සේවාව වැනි සුවිශේෂී ප්‍රදාන ව්‍යාපෘතීන් දැනටමත් ක්‍රියාත්මක කර ඇති අතර ඉන්දියානු නිවාස ව්‍යාපෘතියේ තෙවන සහ සිව්වන අදියර සහ ශ්‍රී ලංකා අනන්‍ය ඩිජිටල් හැඳුනුම්පත් ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේ විවිධ අදියරවල පවතී.

***

***කොළඹ***
***2024 මාර්තු 01***